**සීමාසහිත ජාතික කඩදාසි සමාගම - 2016/2017**

**-----------------------------------------------------------**

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත

ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරවු කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගනකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්න නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදයිත්වය පිලිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් නොවේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 ව්‍යාවනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම නිසා, විගණන මතයක් ප්‍රකාශ කිරීමට හැකි පදනමක් ලබා ගැනීමට සුදුසු ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි මට ලබාගත නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් පල නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම හඳුනාගත යුතු වුවද සමාගමේ දේපල පිරියත සහ උපකරණ යටතේ ඇති ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැය රු.132,274,693 ක් වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ සමාගමේ මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම, පිරිවැය වටිනාකම ඉක්මවා ගණනය කර තිබීම හේතුවෙන් වාර්ෂික අලාභය රු. 532,634 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

ආ 2016 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුමෙහි දක්වා තිබුණු ශේෂයන් සමඟ 2016 අප්‍රේල් 01 දිනට පොදු ලෙජරයේ ආරම්භක ශේෂයන් සන්සන්දනය කිරීමේදී, වත්කම් ගිණුම් ශේෂ 136 කට අදාල රු.3,887,304,944 ක්ද, වගකීම් ගිණුම් ශේෂ 218 කට අදාල රු.3,770,750,351 ක් සහ හිමිකම් ගිණුම් ශේෂ 3 කට අදාල රු.442,884,051 ක් ලෙස රු.8,100,939,346 ක මුළු වෙනස විගණනය වෙත පැහැදිලි කිරීමට කළමණාකාරිත්වය අපෝසත් වී තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

අ රු.49,863,660 ක් වූ ආදායම් ගිණුම් ශේෂ 04 ක් ද, රු.95,447,434 ක් වූ වියදම් ගිණුම් ශේෂ 03 ක් ද, රු. 484,423,303 ක් වටිනා දේපල පිරියත උපකරණ, රු.121,020,606 ක් වටිනා අවසන් තොගය, රු.87,755,556 ක් වටිනා වෙළඳ ලැබිය යුතු දෑ, රු.465,449,058 ක් වටිනා වෙනත් ලැබිය යුතු දෑ, රු.38,005,467 ක මුදල් හා මුදල් සමාන දෑ, රු.160,140,052 ක පොළී සහිත ණය, රු.134,645,393 ක වෙළඳ ගෙවිය යුතු දෑ සහ රු.1,387,796,113 ක් වටිනා වෙනත් ගෙවිය යුතු දෑ ලෙස එකතුව රු.3,024,546,642 ක් වූ ගනුදෙනු සහ ගිණුම් ශේෂ තහවුරු කර ගැනීමට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

ආ 2016/2017 වර්ෂයට අදාල ජාතික කඩදාසි සමාගමේ බැංකු මගින් සිදු වී ඇති ගනුදෙනු පරීක්ෂාවේදී ලංකා බැංකුවේ ගිණුම් අංක 164807 ට අදාලව සිදුවී තිබුණු වටිනාකම රු.3,932,433 ක් සහ රු.6,600,000 ක ගෙවීම් සහ ලැබීම් ගනුදෙනු 35 කට අදාල තොරතුරු ඉල්ලා සිටි නමුත් කිසිදු තොරතුරක් විගණනට ඉදිරිපත් නොවුණි. ගිණුම් අංක 2699996 ට අදාලව ගනුදෙනු 36 ක තොරතුරු ඉල්ලා සිටි නමුත් ඉන් ගනුදෙනු 27 කට අදාල චෙක් පත් වල පිටපත් පමණක් විගණනය වෙත ලැබුණු අතර වටිනාකම රු.55,052,258 ක් වූ ගනුදෙනු 9 කට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. එම චෙක් පත් වලට අනුව පුද්ගලයින් 16 කට රු.11,342,643 ක මුදල් චෙක්පත් ද, කම්කරු කොමසාරිස් වෙත එකතු වටිනාකම් වූ රු.44,528,981 ක චෙක්පත් 2 ක් සහ සේවක අර්ථසාධක අරමුදලට චෙක්පත් 2ක් මගින් රු.19,084,250 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් එම චෙක් පත් වලට අදාල ගෙවීම් වවුචර් සහ කිසිදු සනාථන ලිපියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 46,888,937 පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 71,610,232 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 118,499,169 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් රු.75,290,868 කින් අඩු වීම සහ පරිපාලන වියදම් රු. 72,100,692 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ 2007 අංක 07 දරන සමාගම් පනතේ 148 වගන්තිය පරිදි සමාගමේ ගනුදෙනු නිවැරදි ලෙස වාර්තා කරන හා පැහැදිලි කරන ගිණුම් වාර්තා සහ ආධාරක ලියවිලි තබාගත යුතු වුවද ගිණුම් කාලච්ඡේදයට අදාල ගනුදෙනු හා සිද්ධි සම්බන්ධ ගිණුම් පොත් පත් සහ ගිණුම්කරන සාක්ෂි ආරක්ෂිතව තබාගැනීම සඳහා සමාගමේ නිසි බලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

ආ 2015 පෙබරවාරි 09 දිනට ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවීමට නියමිතව තිබූ හිඟ විදුලි බිල වූ රු.483,997,075 ක් නොගෙවීම නිසා එදින සිට වාලච්චේන කර්මාන්තශාලාවට විදුලිය සැපයීම තාවකාලිකව විසන්ධි කර තිබූ අතර විදුලි සැපයුම නොමැති හෙයින් 2020 ජූනි මාසය දක්වා වාලච්චේන කර්මාන්තශාලාවේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවී නොතිබුණි. කෙසේ වුවද, 2022 සැප්තැම්බර් 08 දිනැති, අංක EP/EE(COM)/CS/Bulk Supply දරන ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කළමණාකාරතුමාගේ ලිපියට අනුව හා 2020 මාර්තු 26 දිනැති, අංක අමප/20/0561/224/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, රු. 361,992,685 ක් වූ දඩ පොලිය කපා හැරීමෙන් පසුව ඉතිරි වූ රු.122,004,390 ක හිඟ විදුලි බිල කම්හලෙහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කරන දින සිට වසර දෙකක කාල සීමාවක් ගතවීමෙන් පසුව එළඹෙන මාස හයක කාලසීමාව තුළ වාරික වශයෙන් ගෙවා අවසන් කිරීමේ කොන්දේසියට යටත්ව අනුමැතිය ලබාගෙන, 2020 ජූලි මාසයේ දී කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට කඩදාසි සමාගම විසින් හිග විදුලි බිල වූ රු.122,004,390 ක වටිනාකමින් රු.10,000,000 ක් ගෙවා ඇති අතර තවදුරටත් රු.112,004,390 ක වටිනාකමක් ගෙවීමට තිබුණි.

ඇ 2020 ජූලි මස සිට සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර පදනම මත බඳවාගත් සේවකයින් 09 ක්ද, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 12 ක් සහ දෛනික වැටුප් පදනම මත බඳවාගත් සේවකයින් 02 ක්ද ලෙස සේවකයින් 23 දෙනෙකු සහ වාලච්චේන කම්හලෙහි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 06 ක් සහ දෛනික වැටුප් පදනම මත බඳවාගත් සේවකයින් 120 ක්ද ලෙස සේවකයින් 126 දෙනෙකු ඇතුළුව මුළු සේවක සංඛ්‍යාව 149 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය සඳහා මෙතෙක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ඈ වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමේදී මහාභාණ්ඩාගාරයේ ඇප සහිතව (Treasury guarantee) 2020 දෙසැම්බර් 09 දින රු. මිලියන 40 ක ණය මුදලක් මාස 06 ක සහන කාලයකට යටත්ව වසර 05 ක කාලයකදී වාරික 54 කින් ගෙවීමේ කොන්දේසි ඇතුලත්ව මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි. තවද, සමාගම විසින් 2021 මැයි මස 17 දින නැවත වරක් රු.මිලියන 100 ක ණය මුදලක් වාලච්චේන කර්මාන්ත ශාලාවේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වසර 05 ක කාලයකදී ගෙවීමට යටත්ව මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි. මෙම ණය මුදල් මහා භාණ්ඩාගාරයේ ඇප සහිතව වෙළඳපල පොළී අනුපාතිකයන් යටතේ ලබාගෙන ඇති අතර රේඛීය අමාත්‍යාංශය වන කර්මාන්ත අමාත්‍යාංශයෙන් කිසිදු අනුග්‍රහයක් ජාතික කඩදාසි සමාගම වෙත ලැබී නොතිබුණි.

ඉ කම්හලේ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කිරීමට කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය (Paper Machine) සහ බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය (Board Machine) ලෙස ප්‍රධාන යන්ත්‍ර 02ක් පැවතුනද වර්තමානයේදී බෝඩ් නිෂ්පාදන යන්ත්‍රය පමණක් භාවිතා කරමින් පැවතුණි. 2020 වර්ෂයේ නැවත වාලච්චේන කඩදාසි කම්හලේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරගෙනයාමේදී බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයේ අක්‍රිය වන සහ යාන්ත්‍රික දෝෂ ඇති වන අවස්ථා වලදී නිසි ක්‍රියාකාරීත්වය සඳහා කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කොටස් ගලවා බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකිරීම සමාගම

අනුගමනය කල ක්‍රමය විය. එලෙස කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් ප්‍රධාන අයිතම 08 ක් බෝඩ් නිෂ්පාදන යන්ත්‍රයට සවිකර ඇති අතර ඒවාහි වටිනාකම රු.34,433,059 ක් විය. ඒ අනුව, විගණිත දිනය වූ 2024 ජනවාරි 22 වන විටත් කඩදාසි නිෂ්පාදන යන්ත්‍රයෙන් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි මට්ටමින් අක්‍රීයව පැවතීම නිසා කාඩ් බෝඩ් නිෂ්පාදනය අඩාල වී තිබුණි.

ඊ 2011 දෙසැම්බර් 19 දිනැති අංක 1037 දරන බදු ගිවිසුම අනුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව නැවත ප්‍රකෘති තත්වයට පත් කිරීමට හා නැවත සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවකට වර්ෂ 30 ක කාලයක් සඳහා අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම යන ආයතන යුගලය සහ අංක 03/43, වෙන්ටනොර් ඇවනිවු, බටහිර පර්ත්, බටහිර ඕස්ට්‍රේලියාව ව්‍යාපාරික ලිපිනයැති සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම අතර ගිවිසුම් ප්‍රකාරව එකඟවූ රුපියල් මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවෙන් රුපියල් මිලියන 200 ක් බදුකරු විසින් ගෙවා නොතිබුණි. තවද, අදාල සමාගම විසින් සුළු කාලයක් නිෂ්පාදන කටයුතු සිදුකර ඇති අතර පසුව ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව සතු කඩදාසි නිෂ්පාදන යන්ත්‍රය සෙලාන් බැංකුව වෙත රු.418,483,037 ක වටිනාකමකට උකස් තබා 2012 වර්ෂයේදී කම්හල හැර යාමට කටයුතු කර තිබුණි. මෙම උකස නිරවුල් කර ගැනීමට දෙවන බදු කරු විසින් රු.මිලියන 120 ක මුදලක් බැංකුව වෙත ගෙවීමට සිදු වී තිබුණු අතර නිසිපරිදි බදු වාරික නොගෙවීම මත රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති උපදෙස් මත අදාළ බදු ගිවිසුම 2014 සැප්තැම්බර් 25 දින අවලංගු කර තිබුණද 2011 දෙසැම්බර් 19 දින සිට ගිවිසුම අවලංගු කල කාලය වූ 2014 සැප්තැම්බර් 25 දක්වා වූ වර්ෂ තුනක කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රුපියල් මිලියන 42 ක බදුකුලිය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම නිෂ්පාදන යන්ත්‍ර සෙලාන් බැංකුව වෙත උකස් තැබීම සඳහා ජාතික කඩදාසි සමාගම නියෝජනය වන පරිදි ගිවිසුමට එළබි පාර්ශව නිශ්චිතව හඳුනාගෙන එම වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමාගමට සිදුවූ අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ගිවිසුමට එලඹුණු සීමාසහිත පර්ත් ඉංජිනේරු හා මේන්ටෙනන්ස් (පුද්ගලික) සමාගම නිෂ්පාදන කටයුතු නතර කිරීම හේතුවෙන් ගිවිසුම කඩවීම පිළිබඳව බදුදීමනාකාර පාර්ශවය විසින් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

උ ජාතික කඩදාසි සමාගමේ ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව 2022 මාර්තු 09 දිනැති බදු ගිවිසුම යටතේ කේඑස්පීඒ ඇඹිලිපිටිය කඩදාසි කම්හල් (පුද්ගලික) සමාගම (KSPA Ambilipitiya Paper Mills private limited) වෙත රු. මිලියන 260 ක ප්‍රතිශ්ඨාවක් මත වසර 30 ක කාලයකට බදු දී ඇත. ගිවිසුම අනුව මාස 18 ක් තුළ නිෂ්පාදන කටයුතු ආරම්භකළ යුතු අතර එම කාල සීමාව තුලදී රු. 13,000,000 ක වාර්ෂික බදුකුලී වාරිකයක් බදුගැනුම්කරු විසින් සමාගමට ගෙවිය යුතුය. නිෂ්පාදන කටයුතු ආරම්භකළ පසු බදු ගිවිසුම අනුව විකුණුම් ආදායම මත 3% කට සමාන වටිනාකමක් බදුකුලී වාරිකය ලෙස ගෙවිය යුතුය. කෙසේ වුවද අදාල සමාගම විසින් මෙතෙක් නිෂ්පාදන කටයුතු ආරම්භකර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i). 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2016/2017 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර 2023 පෙබරවාරි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.